# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIMS)

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා නිසි පරිදි සුදුසුකම් ලත් අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නාමාවලිය ප්‍රකාරව අධ්‍යක්ෂවරයා පූර්ණකාලීන නිලධාරියෙකු වන අතර, ඔහු ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී සහ ගිණුම්කරණ නිලධාරියා ද වේ. අධ්‍යක්ෂවරයා නිලබලයෙන්ම ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු සහ සභාපතිවරයා ද, ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ නිලබලයෙන් සාමාජිකයකු ද වන්නේය. මෙම තනතුරේ නිල කාලය වසර තුනක් වන අතර, අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු මෙන්ම අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 63 ට අඩු පුද්ගලයකු විය යුතුය.

අපේක්ෂිත අයදුම්කරු සතුව මණ්ඩල සහතිකකරණයක් හෝ වෛද්‍ය විශේෂඥතාවයේ ආචාර්ය උපාධියක් (PhD හෝ ඊට සමාන) සුදුසුකම් තිබිය යුතුය. අධ්‍යයන ආයතන පරිපාලන පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත. තෝරාගන්නා අයදුම්කරු බහු විෂය අධ්‍යයන පරිසරයක රාජකාරී කිරීමට අවශ්‍ය අන්තර් පුද්ගල කුසලතා සහිත අයකු මෙන්ම ප්‍රජාව කෙරෙහි තිබෙන ආයතනයේ වගකීම පිළිබඳව අවබෝධයක් ද තිබිය යුතුය. අධ්‍යයන කටයුතු පිළිබඳ නායකත්වය ලබාදීම සම්බන්ධව ද ඔහු/ ඇය වගකිවයුතු වේ.

තනතුරට අදාළ වැටුපක් සහ වෙනත් දීමනාවන්ද ලබාගැනීමට අධ්‍යක්ෂවරයා සුදුසුකම් ලබයි.

**අයදුම්පත සමග පහත දැක්වෙන ලියකියවිලි අමුණා එවිය යුතුය.**

I. උපන් දිනය ද ඇතුළුව අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක්.

II. ආයතනයේ සංවර්ධනය උදෙසා වන දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ අධ්‍යක්ෂ තනතුරට පත්වීම ලදහොත්, අයදුම්කරු විසින් ළඟාකර ගැනීමට අපේක්ෂා කරනු ලබන අරමුණු පිළිබඳව කෙටි විස්තරයක්.

III. අයදුම්කරු රාජ්‍ය සේවය, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සහ උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවා යෝජකයාගෙන් ලිපියක්.

අයදුම්පත් 2026 ජුනි 10 වන දින පස්වරු 3.30 හෝ ඊට පෙර ලැබෙන පරිදි "**සහකාර ලේඛකාධිකාරී, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ගැටඹේ, පේරාදෙණිය**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පෞද්ගලිකව පැමිණ භාර දීම කළ හැකි අතර, අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**අධ්‍යක්ෂ තනතුර, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**" යනුවෙන් සඳහන් කළ යුතුය.

මීට අමතරව, ඉහත ලේඛනවල මෘදු පිටපත් සහ වෙනත් ඕනෑම ආධාරක ලේඛනයන් PDF ආකෘතියෙන් විද්‍යුත් තැපෑලෙන් ar@pgims.pdn.ac.lk වෙත එවිය යුතුය.

අධ්‍යක්ෂ තනතුරට පත් කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩි විස්තර සඳහා 2024 ජනවාරි 01 දිනැති අංක 01/2024 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය වෙත යොමු වන්න. කරුණාකර මෙම තනතුරට පත්කිරීම සම්බන්ධව අවශ්‍ය වැඩිදුර තොරතුරු සඳහා ද ඉහත චක්‍රලේඛය වෙත යොමුවන්න.

සාමාන්‍ය රාජකාරී වේලාවන්හි 081-2389757 අංකයට ඇමතීමෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අයාතනයේ සහකාර ලේඛකාධිකාරී වෙතින් වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

**සහකාර ලේඛකාධිකාරී,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය,**
**2026 මැයි 10 වැනි දින**